# ලංසු සඳහා ආරාධනයයි

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ යෝජිත නවීකරණ කටයුතු සිදු කිරීම

1. කොළඹ 08, ඇල්විටිගල මාවත, අංක 276 හි පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන්, එම කොමිෂන් සභාවේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) සභාපතිතුමා විසින්, පහත සඳහන් විස්තරවලට අනුකූලව අංක 276 , ඇල්විටිගල මාවත, කොළඹ 08 දරන ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා ගොඩනැගිල්ලේ යෝජිත නවීකරණ කටයුතු සිදු කිරීම සඳහා යෝග්‍ය සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා, තැබූ ලංසු මෙයින් කැඳවනු ලැබේ.

   කාර්යය සඳහා අදාළ විෂය පථය

   ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන ගොඩනැගිල්ලේ සිදු කිරීමට යෝජිත නවීකරණ කටයුතු

   ප්‍රධාන ගොඩනැගිල්ලේ සිදු කිරීමට යෝජිත නවීකරණ කටයුතුවල විෂයය පථයට, වහල ටෙරසය මත දැනට පවතින වහල ආවරණය ඉවත් කිරීම, සැහැල්ලු බරැති බ්ලොක් බිත්ති, ඇලුමිනියම් කොටස් සහ ඇලුමිනියම් කවුළු සහිතව නව ශාරීරික සුවතා මධ්‍යස්ථානයක් සහ ලේඛන ගබඩා කාමරයක් ඉදිකිරීම, වානේ වහල ව්‍යුහයක් මත සින්ක් ඇලුමිනියම් තහඩු යොදා වහල ආවරණයක් සකස් කිරීම, ඇස්බැස්ටෝස් රහිත සිමෙන්ති තන්තු තහඩු සිවිලිමක් සකස් කිරීම, සනීපාරක්ෂක උපාංග සහිත ටයිල් නිමාවකින් යුත් වැසිකිළි ඒකකයක් ඉදිකිරීම, දැනට පවතින ජල ටැංකි ප්‍රතිස්ථාපනය කිරීම සහ ඉදිරිපස ආලින්දයේ වහල තට්ටුව සඳහා ජල ආරක්ෂණ කටයුතු සිදු කිරීම ද ඇතුළත් වේ.

   ආපනශාලා ගොඩනැගිල්ලේ යෝජිත නවීකරණ කටයුතුවලට, දෙවන මහලේ නව කාන්තා වැසිකිළි ඒකකයක් ඉදිකිරීම, ඒ සඳහා නව ජලනළ පද්ධතියක් සැපයීම හා සවිකිරීම මෙන්ම අවශ්‍ය සනීපාරක්ෂක උපාංග සැපයීම හා ස්ථාපනය කිරීම ඇතුළත් වේ.

   අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 යන ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පරිශ්‍රය තුළ මෙය පිහිටා ඇත.

   ඉදිකිරීම් කාලසීමාව දින 270කි.

   මුළු ඇස්තමේන්තු පිරිවැය රුපියල් මිලියන 83කි (එකතු කළ අගය මත බද්ද **-VAT** ඇතුළත් නොවේ)

2. මෙම ලංසු කැඳවීම ජාතික තරගකාරී ලංසු තැබීමේ ක්‍රියාපටිපාටිය යටතේ සිදු කරනු ලැබේ.

3. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබීම සඳහා, සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත කර නොතිබිය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතුය.

   ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචිය අවශ්‍ය වේ.

   **අවශ්‍ය ලියාපදිංචි සුදුසුකම්;**
   **විශේෂඥ ක්ෂේත්‍රය :** ගොඩනැගිලි ඉදිකිරීම්
   **අදාළ ශ්‍රේණි :** ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන් සඳහා C5 / C4 / C3 (අදාළ ලංසුකරුගේ සාමාජිකත්වය ලංසු භාර ගැනීම අවසන් වන දිනය දක්වා වලංගුව පැවතිය යුතුය)

4. කොන්ත්‍රාත්තුව ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සපුරාලිය යුතු අවශ්‍යතා වන්නේ;
   - පසුගිය වසර පහක කාලය තුළ සිදුකර ඇති ඉදිකිරීම් කටයුතුවල සාමාන්‍ය වාර්ෂික වටිනාකම අවම වශයෙන් රුපියල් මිලියන **133.0** ක් විය යුතුය.
   - මෙම ව්‍යාපෘතිය සඳහා පමණක් අවශ්‍ය වන අවම ද්‍රවශීල වත්කම් සහ/හෝ ණය පහසුකම් ප්‍රමාණය රුපියල් මිලියන **28.0**ක් විය යුතුය
   - පසුගිය වසර 10ක කාලය තුළ, මෙම කාර්යයට සමාන ස්වභාවයක් හා සමාන සංකීර්ණතා මට්ටමක් සහිත, රුපියල් මිලියන **67.0**ක් හෝ ඊට වැඩි වටිනාකමකින් යුත් අවම වශයෙන් එක් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් (අවම වශයෙන් 50%ක වැඩ ප්‍රමාණයක් සම්පූර්ණ කරන ලද) සාර්ථකව නිම කිරීමේ පළපුරුද්ද ලංසුකරු සතු විය යුතුය.

5. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට මෙම ප්‍රසම්පාදනයට අදාළ වැඩිදුර විස්තර අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අධ්‍යක්ෂ පාලන සහ ආයතනික කටයුතු වෙතින් ලබාගත හැකි අතර, **2026/09/17** දින සිට **2026/10/06** දින දක්වා සතියේ රාජකාරි දිනවල **පෙ.ව. 09.00** සිට **ප.ව. 03.00** දක්වා, කොළඹ 08, ඇල්විටිගල මාවත, අංක 276 පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පාලන සහ ආයතනික කටයුතු අංශ කාර්යාලයේදී ලංසු ලේඛන පරීක්ෂා කිරීමට හැකිය.

6. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2026.09.17** සිට **2026.10.06** දක්වා සතියේ රාජකාරි දිනවල **පෙ.ව. 9.00** සිට **ප.ව. 2.30** දක්වා , රු. 12,500.00 ක ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් මුදලින් ගෙවා, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08, පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ පාලන සහ ආයතනික කටයුතු වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය.

7. ලංසු **2026/10/07** දින **ප.ව. 2.00 ට** හෝ එදිනට පෙර, පාලන සහ ආයතනික කටයුතු අංශය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ – 08 යන ලිපිනය වෙත ලැබෙන සේ භාරදිය යුතුය. නියමිත වේලාවෙන් පසුව ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, සහභාගී වීමට කැමති ලංසුකරුවන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

8. සෑම ලංසුවක් සමගම රු. 800,000.00 ක ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතු අතර, එම ඇපකරය **2026/10/07** දින සිට **2027/02/03** දින දක්වා බලපැවැත්විය යුතුය (එම කාලසීමාව ලංසු වලංගු කාලය අවසන් වීමෙන් අනතුරුව තවත් දින 28ක කාලයක් සඳහා වලංගු විය යුතුය).

9. ලංසු ඉදිරිපත් කිරීමට පෙර පැවැත්වෙන පූර්ව ලංසුකරුවන්ගේ රැස්වීම **2026.09.29** දින **පෙ.ව. 11.00.** ට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ දී පැවැත්වේ.

**සභාපති ,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) ,**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ,**
**අංක : 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.**
**2026.09.16**